# Living the LOTUS

Buddhism in Everyday Life

8
2018

VOL. 155


FOUNDER'S ESSAY

## තමාට සහයෝගිත්වය දක්වන පිරිසක් ඇතිකරගන්නා ආකාරය

ව්‍යාපාරයක් කරද්දී, වැඩි ලාභයක් ලබාගන්නේ කෙසේද? යන්න සිතනවාට වඩා, භාණ්ඩ මිලදී ගන්නා පුද්ගලයන් ගැන සිතනවානම් ව්‍යාපාරය අනිවාර්යයෙන්ම සාර්ථක වනවා යැයි කියමනක් ඇත. ඒ තුල පුද්ගලයන් එකිනෙකා අතර තිබෙන්නාවු මානුෂීය බැඳීමේ රහස ඇත. අපි සෑම විටම තමා සිතනා ආකාරයයි හරි, යන හැඟීමෙන් අන්‍යයන්ට බලපෑම් කරයි. තමා සිතනා ආකාරයට සිදුවීම් නොවන විට සිත සංසුන් නොවේ. නමුත්, එසේ තමාට වුවමනා ආකාරයට කොපමණ ශක්තියක් යොදවා කටයුතු කලද, සෑම සියළුදෙයම තමා සිතනා ආකාරයට සිදු නොවේ.

එබැවින් මම නිතරම, අන්‍යයන්ගේ අදහස් වලට ඇහුම්කන් දීමට කටයුතු කලෙමි. ඉන් පසු එයට මාගේ අදහස් ගලපා ගෙන එකඟත්වයක් ඇති කරගන්නා ආකාරය කල්පනා කලා. එවිට සෑම කෙනෙක්ම සිතේ සැහැල්ලුවෙන් තම සහය මා වෙත දක්වන්නට පෙලෙඹුණි.

කොපමණ තම අදහස් වලට අනුව කටයුතු කිරීමට උත්සහ කලද, අපට තනිවම කලහැකි දේ වල සීමාවක් ඇත. එබැවින් තමා සමඟ සහයෝගයෙන් කටයුතු කරන්නාවු පිරිසක් ඇති කරන්නේ කෙසේද යන්න ඉතාම වැදගත්ය. 'ඔබ සියළුදෙනාම බෝධිසත්ව චර්යයාවේ යෙදෙන්නාවු අය' ලෙස තමාගේ අවට සිටින පිරිස ගැන ගෞරවනීය හැඟීමට පත්වන විට තමාගේ තනි අදහස් පමණක්ම අන්‍යන්ට පැවසීම නැතිවී යයි.

සෑම විටම අන්‍යයන්ට ගලපා ගන්නට කටයුතු කරන විට, අන්‍යයනුත් අනිවාර්යයෙන්ම තමාට අවනත වේ. ඒ හදවත් වලින් එකිනෙකාගේ සන්නිවේදනය සිදුවන නිසාවෙනි.

*Kaiso zuikan* 9 පි. 124-125


Living the Lotus
Vol. 155 (August 2018)



Rissho Kosei-kai International
Fumon Media Center 3F, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537 Japan
Tel: +81-3-5341-1124
Fax: +81-3-5341-1224
E-mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp



**Senior Editor:** Koichi Saito
**Copy Editors:** P.A.D. Somapala, G.N. Ruklanthi, Sahan Chamara
**Editor:** Eriko Kanao
Editorial Staff of RK International


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත් , කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන , සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදි නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන් , සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජිවිතයට සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘද්ධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මඟින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

## President's Message

# ගෞරවනීය හැඟීම හා ලැජ්ජාසහිත හැඟීම



නිචිකෝ නිවානෝ
රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන ප්‍රධානී තුමා

### බුදු හිමියන්ගේ උපදේශය

මේ මාසයේදී 'ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ', 'යහපත් ක්‍රියාව' ගැන කල්පනා කර බලමු. 'යහපත් ක්‍රියාව' නියමාකාරයෙන් ගෙන හැර දක්වන්නේ 'යහපත් කර්මාන්තය' ලෙසයි. එය 'සිත, කය, වචනය යන තුන්දොර'ට අනුව 'කයෙන් කරන ක්‍රියාවන්' නිවැරදිව පවත්වා ගන්නා ආකාරය වේ. මෙම සඟරාවෙම 6 වෙනි හා 7 වෙනි මාස වලදී 'නිවැරදි සිතුවිලි' හා 'නිවැරදි වදන්' මෙම තුන් දොරෙහි සිත හා වචනය නිවැරදි ආකාරයට පවත්වා ගන්නා අයුරු කියාදුනි..

එසේනම්, නිවැරදි කායික ක්‍රියාවන් යනු කුමක්ද? පානාතිපාතා වේරමණී, අදින්නාදනා වේරමණී, අබ්‍රහ්මචරියා වේරමණී යන කරුණු 3 වන, සතුන් මැරීමෙන් වැළකීම, සොරකම් කිරීමෙන් වැළකීම, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම ආදිය නිවැරදි කායික ක්‍රියාවන් වේ.

ධම්ම පදවල මෙවැනි කවියක් ඇත. ''සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනො අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ'' සදහන් පරිදි, සියල්ලෝම දඬුවමට තැති ගනිති, සියල්ලෝම මරණයට බිය වෙති, සොරකමට ලක් වීමෙන් හා අනියම් සබඳතා තුලින් තමා වේදනාවට පත්වන බව දැනගෙන, තමා විසින් අන්‍යයන්ට එසේ නොකල යුතුය.

මේ ලොවෙහි තිබෙන්නාවු දුකින් මිදෙන ආකාරය අවබෝධ කර ගත් බුදුන් වහන්සේ, දුකට හේතුව අවබෝධ කරගෙන, එයින් මිදෙන ආකාරය අපට කියා දුන්හ. එබැවින් එම කරුණු අවවාද ලෙස නොව, අපට එදිනෙද ජීවිතය දීප්තියෙන්, විනෝදයෙන් ගත කිරීමට පහසුකර දෙන් වදන් ලෙස භාර ගැනීම යහපත්ය. 'මෙම කරුණ අප අමතක නොකරන්නේ නම්, පවුලත්, සමාජයත් සතුටින් ජීවිතය ගත කිරීමට හැකිවේ' ලෙස ලබා දෙන බුදුන් වහන්සේගේ උණුසුම් අවවාද වේ.

## ‘යහපත් ක්‍රියාවේ’ සාමාන්‍ය පරිදි එදිනෙදා නිරතවීම

සතුන් මැරීමෙන් වැළකීම, සොරකම් කිරීමෙන් වැළකීම, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම නිවැරදි කායික ක්‍රියාවන් වේ. නිසැකවම, ඒවා නිවැරදි ක්‍රියාවන් බවට කිසිම සැකයක් නැත, එම නිසයි පර පණ නැසීමට හා සොරකම් කිරීමට නිතිය ක්‍රියාත්මක වන්නේ. නමුත්, ‘මේවා කිරීමෙන් වැළකෙමු’ ලෙස තහනම් නියෝග දමා තිබෙන දෑ, ප්‍රායෝගිකව නොකර සිටීම ඉතා අසීරු බව මානසික විද්‍යාවේද සඳහන් වේ. එබැවින් ‘වැළකිය යුතු ශීලයන් ආරක්ෂා කරමු’ යන හැඟීමට ප්‍රථම, නිතරම ස්වභාවයෙන්ම ‘දුකක් ඉතිරි නොවන යහපත් ක්‍රියාවන්’ වල නිතරම යෙදීමට කටයුතු කරමු.

එසේ කිරීමට මුලික වන්නේ අපගේ, ගෞරවනීය හැඟීම හා ලැජ්ජාසහිත හැඟීම යි.

අපි බෞද්ධයෝ ලෙස බුදුන් වහසේට ගෞරව කරමින්, ‘බුදුන් වහන්සේ ලෙස වන්නට’ ප්‍රාර්ථනා කරමින් ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගනියි. එසේ කිරීමේදී ටිකෙන් ටික තම දුර්වලතා හඳුනා ගැනීමට හැකිවේ.

ඒ ගැන ජපානයේ ප්‍රසිද්ධ විද්වතෙකු වන මසහිරො යසුඔක මහතා මෙසේ සඳහන් කරයි. ‘ගෞරවනීය හැඟීම යනු, තමාගේ දියුණුව ඇති කර ගෙන, ආධ්‍යාත්මික සුවය ලබා ගැනීමයි. ඒ සමඟම තමා ගැන පසු විපරම් කරමින්, තමාගේ දුර්වලකම් ගැන ලැජ්ජාවට පත්වීමයි.’ ලෙස සඳහන් වේ. නමුත් අපට ඉතාම වැදගත් වන්නේ, මෙහි ඉතිරි කොටසයි. එනම්, ‘තමා ගැන ආවර්ජනා කරමින්, තමාගේ වැරදි අඩුපාඩු හඳුනා ගනිමින්, සමාවේ යෙදීමත්, නැවත නොකිරීමටත් වග බලා ගතයුතුය.’ එසේ ලැජ්ජා සහගත හැඟීමෙන් යුතුව, තම අඩුපාඩු හඳුනාගෙන, දෙවියන් බුදුන් ප්‍රාර්ථනා කරන්නා වු ආකාරයට කටයුතු කිරීමට හදවත යොමුකල යුතු බවයි එහි සඳහන් වන්නේය. තවත් සරළව පවසනවා නම්, ‘‘බුදුන් සරණ ගොස්, ධර්මයේ හැසිරෙනවා නම්, නිවැරදි ක්‍රියාවන් ස්වභාවයෙන්ම කල හැකි පුද්ගලයෙකු බවට පත්වේ’’.

ගෞරවනීය හැඟීම හා ලැජ්ජාසහිත හැඟීම ප්‍රගතිය හා දියුණුව අපේක්ෂා කරන පුද්ගලයන් තුල සහජයෙන්ම පිහිටා ඇත. නමුත් නිතරම ආත්මාර්ථකාමීත්වයට පත්වී වෙනත් මඟකට යොමු වන අපට, නැවත නියම මානුෂීය ජීවන ගමනට යොමු විය හැකි වන්නේ, මෙම ගෞරවනීය හැඟීම හා ලැජ්ජාසහිත හැඟීම තිබෙන නිසාය.

‘නිවැරදි ක්‍රියාව’ යනු ‘ගෞරවනීය හැඟීමෙන් හා ලැජ්ජාසහිත හැඟීමෙන්’ යුතුව හදවත හා ක්‍රියාව එක් කොට කටයුතු කිරීමෙන් ඇතිවන යහපත් මානුෂීය සබධතාව, පවුල් තුලත් රටේත් සාමය ගොඩ නැගීමට පාදකවන වැදගත් කරුණකි. ඒ හැඟීමෙන් කටයුතු කිරීමේදී විටෙක මංමුලාවන හැඟීමට පත් වුවද, ඒ තුලින්ම විශාල ශක්තියක් ගොඩනැගීමට හැකිවේ.

From *Kosei*, August 2018



# නිවැරදිව, ඇති සැටියෙන් දැකිමට කටයුතු කිරීමෙන් ලැබෙන සතුට

බතා අරිවුනා
උලාන්බාතර් ශාඛාව

මෙම කතාව 2018 වර්ෂයේ 4 වන මස 15 වන දින මොන්ගෝලියාවේ, උලාන්බාතර් ශාඛාවේදී ගොමෙයිනිචි දවසේ පවත්වන ලද්දකි.

ගොමෙයිනිචි දවසේ දී මට සෙප්පෝවක් කිරීමට අවස්ථාව ලැබීම පිලිබද සතුටත් සමගම හදවතින්ම ස්තූතිවන්ත වෙනවා. මගේ නම බතා අරිවුනා. 1966 වර්ෂයේ දී මම උපත ලැබුවේ. මට සහෝදරියන් දෙදෙනෙකු සිටිනවා. රැකියාව නව බෝග වර්ග නිපදවීම නමුත්, මට ගණකාධිකරන උපාධියක්ද තිබේ. 2005 වර්ෂයේ උලාන්බාතර් වල, සොරිගුමා ශිබුචෝ සාන්ගේ හමුවීම රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයට ඇතුලත් වීමට මූලික අඩිතාලම විය. සොරිගුමා ශිබුචෝ සාන්ගේ ආරාධනයෙන් උලාන්බාතර් ශාකාවේ පැවති විවිධ වැඩසටහන් වලට සහභාගි වු නමුත්, මුල් දවස් වල සංවිධානයේ සාමාජිකයෙකු බවට පත් වීමට අදහසකක් නොතිබිනි. ඒ මට කුඩාකල සිටම ආගම ගැන හැගීමක් නොතිබීමත්, බුදුදහම ගැනද විශ්වාසයක් නොතිබුන හෙයිනි. විශ්ව විද්‍යාලයේ ඉගෙනීමෙන් පසුව මොන්ගෝලියාවේ ඉතා ප්‍රසිද්ධ පන්සලක් වන ගන්දන් විහාරයේ හාමුදුරු නමක් සමඟ බුදුන් වහන්සේගේ පැවැත්ම ගැන තර්ක විතර්ක කලා. මම විශ්ව විද්‍යාලයේ දර්ශන විද්‍යා උපාධිය ඉතා ඉහලින් සමත් වී සිටි නිසා සියලු දේ හොදින් දන්නවා කියා, අහංකාරකමින් සිටියේ. ඒ කාලය මතක් වනවිට දැන් නම් දැන් නම් ලැජ්ජාවක් ඇති වෙනවා.



උලාන්බාතර් ශාඛාවේදී සෙප්පෝව පවත්වන අරිවුනා මහත්මිය

රිෂ්ෂෝ කෝසෙයිකායි වැඩසටහන් වලට කිහිප වතාවක්ම සහභාගී වනවිට බුදුන් වහන්සේගේ ධර්මය රිෂ්ෂෝ කෝසෙයි කායි ඉගැන්වීම් පිලිබද ගැඹුරු වැටහීමක් ලැබුනි. ‘අන්‍යයන් ප්‍රථමයෙන්’, ‘අධ්‍යාත්මික පරිපූර්ණත්වය’ හා ‘සැමදෙනාගේම සතුට’ ප්‍රර්ථනා කරන කෝසෙයි කායි ඉගැන්වීම් විශිෂ්ටයි කියා වටහා ගැනීමට හැකිවිය. තවදුරටත් උලාන්බාතර් ශාකාවේ සාමාජිකයන්ගේ උණුසුම් හමුවීම් සහ හෝසා වටවලට හිත බැදී ගොස්, නැවතත්සාමාජිකයන්ව හමුවන දින තෙක් සතුටින් බලාසිටින්නට විය. ඉන්පසු 2009 වර්ෂයේ දී සාමාජිකත්වය ලබාගතිමි.

සාමාජිකත්වය ලබා කල් නොගොස් සොරිගුමා ශිබුචෝ සාන්ගේ අධ්‍යාපන අංශයේ කටයුතු කරන්නට මාව යොමු කලහ. එහෙත් සාමජිකත්වය ලබා වැඩිකලක් නොමැති බැවින් ඉගැන්වීම් පිලිබද දැනීමක් නොමතිකමත්, නොදන්නා දේ වැඩි නිසාත් රාජකාරිය බාරගැනීමට නොහැකිය යැයි පැවසුවත්, ‘ධර්මය ඉගෙන ගෙන ප්‍රායෝගික පුහුණුවේ යෙදෙනවාට වඩා, ධර්මය ඉගෙන ගනිමින් ප්‍රායෝගික පුහුණුවේ යෙදීම වැදගත්’ යැයි සොරිගුමා ශිබුචෝ සාන් කියා දුන්හ. ඉන් පසු අධ්‍යාපන අංශයේ රාජකාරිය කටයුතු කරන්නට බාරගතිමි. උලාන්බාතර් ශාකාවේ සහ ප්‍රාදේශිය ශාකාවල සාමාජිකයන්ට පූජාවිධි පුහුණුව කියාදෙමින් සිටිනවා. තවද, රිෂ්ෂෝ කෝසෙයි කායි මූලස්ථානයේ සහයෝගයෙන් සිදු කරන ‘මොන්ගෝලියානු හෙද පුහුණු වැඩසටහන’ රාජකාරි කරමින්, ශාකාවේ මුදල් පරිපාලනයද, බයන්ගොල් ප්‍රදේශයේ හෝසා නායිකාවක් ලෙසද කටයුතු කරනවා.

2011 හා 2012 වර්ෂ වල ජපානයේ පැවැත්වූ නායකත්ව පුහුණු සම්මන්ත්‍රණයට සහාභාගි වී ලෝකයේ පුරා සිටින විශිෂ්ඨ බෝධිසත්වයන් සාමාජිකයන් සමග මිත්‍රයන් වීමට හැකිවිය.වෙනත් රටවල සාමාජිකයන් සැමදෙනාම කුමන දෙයක් වුවද බුදුන් වහන්සේගේ ධර්මය හොදින් පිළිපදින ආකාරය පිලිබද පැහැදී, මමද එසේ වීමට සිතාගතිමි.

2017 වර්ෂයේ 10 වන මස ධර්මාචාර්යය ලබාගෙන, මෙම වර්ෂයේ 5 වන මස උලාන්බාතර් ශාකාවේ සිට කිලෝමීටර 350 ක් පමණ දුරින් තිබෙනා එල්ඩිනෙට් ශාඛාවේ

බුදු පිළිම වහන්සේ තැන්පත් කිරීමේ උත්සවයට යාමට තේරුණා. එම රාජකාරිය කිරීමෙන් මගේ හදවත හොඳින් තේරුම් ගැනීමට හැකියාව ලැබුණි.

7 වන මස 1 වන දින එල්ඩිනෙට් ශාඛාවේ බුදු පිළිම වහන්සේ තැන්පත් කිරීමේ තැන්පත් කිරීමට අවස්ථාව උදාවිය. එම පිළියෙල කිරීම් වලට 5 වන මස 8 වන දින සහ 9 වන දින උලාන්බාතර් ශිබුචෝ සොරිගුමා ශිබුචෝ සාන්, සොරිගුතෝ සාන්, මුදල් පරිපාලක, මම යන 4 දෙනා එල්ඩිනෙට් හොසා ස්ථානයට අවස්ථාව ලබාතිමි.එම ප්‍රදේශයට ලගාවූ විට ප්‍රදේශය භාරව කටයුතු කරන හෝසා නායිකාව පුටුවේ ඉද සිටියේදීම අපව පිළිගතිමි. ඉන්පසු සූත්‍ර සක්ඣායනය නමුත් හෝසා නායිකාව සූත්‍ර සක්ඣායනයට සහාභාගී නොවී වෙන දෙයක් සිදුකරමින් සිටියා. එයත් මාගේ සිත නොසතුටට පත් විය. සක්ඣායනයෙන් පසු එන හෝසා නායිකාව ගෙන් එල්ඩිනෙට් ප ු දේශයේ වර්තමාන තත්වය සහ සාමාජිකයන්ගේ තත්වය පිලිබද, හෝසා ස්ථානයේ මුදල් පරිපාලනය පිලිබද විමසීය. එසේ කලවිට හෝසා නායිකාව ගේ මුහුනේ පාට වෙනස් වී (අපි ධර්මය හොඳින් ඉගෙනගෙන සිටිනවා, භාරදෙන රාජකාරි හොඳින් ඉටු කරනවා ඇයි අපගේ උත්සහයන් අගය නොකරන්නේ ශාඛා ප්‍රධානී තුමිය අපව ප්‍රසංශා කලා යැයි කීවේය. මම එම හෝසා නායිකාවගේ වචන පැමිණිල්ලක් ලෙස සිතා, තවදුරටත් (දුරසිට පැමිණෙන අයට නැගිට පිළිගන්නා එක සාමාන්‍ය දෙයක් කියා සිතා, හිත ඇතුලේ හෝසා නායිකාව වැරදියි කියා සිතා ගත්තා.

එම අවස්ථාවේ නිචිකෝ නිවානෝ තුමාගේ ‘හොඳ නරක කියා බෙද වෙන්නොකර ඇතිදේ ඇති සැටියෙන් බැලිය යුතුය’, ‘වෙනස් කෝණයකින් බැලුවහොත් මිනිසුන්ගේ හොඳ තැන් පෙනේ’ යන කියා දීම මතකයට නැගින. නැවතත් සන්සුන් බවට පත් වී අවට බැලූකල එම දින හෝසා නායිකාව මිණිපිරියව රැගෙන පැමිණ සිටි බැවින් හැමදම සක්ඣායනයට සහභාගි වන නමුත් එදින මිණිපිරියව බලාගැනීමට සිදුවූ නිසා සහභාගී නොවී සිටි බව තේරුම් ගොස් හෝසා නායිකාවගේ උත්සහාය කැපවීමෙන් කටයුතු කරන ආකාරය පෙනෙන්නට විය, බුද්ධ ස්භාවයද තේරුම් ගැනීමට හැකි විය.

මාර්තු මාසයේ කෝව්ස්ගෝල් ශාකාවට ධර්ම ප්‍ර චාරනයට අවස්ථාව ලැබින .කලින් වතාවට සමාන සිදුවීමක් සිදුවිය.කෝව්ස්ගෝල් වල නායකයාව මීට පෙර හමුවී නොමැති නිසා කුමන පුද්ගලයෙකුද යන්න කල්පනාකරමින් එම ප්‍ර දේශයට ගියෙමි. එම අවස්ථාවේ ධර්ම ප්‍ර චාරනයේ පසුබිම සොරිගුමා ශිබුචෝ සාන්ගෙන් පවරා තිබූ මෙහෙවරක් විය. පසුගිය වර්ශයේ, කෝව්ස්ගෝල් වල නායකයා ජපානයේ ඔඑශිකි උත්සවයට සහාභාගී වීමට අවශ්‍යයි යයි පවසා තිබුණි. මේ දවස් වල නායකයාට පිළිකාවක් වැලදී, එයට ප්‍රථිකාර කරමින් සිටින නිසා, (මේ වර්ෂයේ ඔඑශිකි උත්සවයට සහභාගී නොවන්නේ නම් හොද යැයි ) සොරිගුමා ශිබුචෝ සාන් පැවසීය. කෙසේ වෙතත් එම වචන කෝව්ස්ගෝල් වල නායකයාගේ හිත් අමනාපයට හේතු විය.ඉන් පසු එම ‘මට නායකත්වයෙන් ඉවත්වීමට වුවමනාය’ ලෙස පවසමින් දුරකතනයෙන් උලාන්බාතර් ශාකාවට පැවසුවේය. එම නිසා කෝව්ස්ගෝල් ශාකාවේ ධර්ම ප්‍රචාරනයට ප්‍රථම, මම සොරිගුමා ශිබුචෝ සාන් එම ශාඛාවේ තත්වය හොඳින් ග්‍රහනය කරගන්න’ යැයි පැවසුවේය.

එල්ඩිනෙට් හෝසා කණ්ඩායම වාගේම අප සැවොම පැමිණිය පසු, කෝව්ස්ගෝල් වල නායකයා ඉද සිටියදී පිළිගත්තා. අප සාමාන්‍යයෙන් දුර සිට පැමිණෙන අයව පිලිගන්නේ නැගිට එය සාමාන්‍යය දෙයක් වුනත්, ඉදගෙනම පිළිගත් නිසා
පුදුමයට පත් විය.

ඒත්, මම කෙසේ වෙතත් එම ප්‍රදේශය භාරව කටයුතු කරන අයගේ හොද දේ දකිමු, කියන ඉගැන්වීම විශිෂ්ඨය කියා කියා දුන්හ. ඉන්පසු නායකයා ඇතුලුව ප්‍රදේශයේ 8 දෙනෙකු සමග ආශිර්වාද සූත්‍ර සක්ඣායනයක් කලහ. එසේ කලවිට නායකයාගේ මුහුණේ ප්‍ර කාෂනය සන්සුන් බවට පත්විය. උලාන්බාතර් වලට ආපසු පැමිණිය විට, එම නායකයාගේන් සොරිගුමා ශිබුචෝ සාන්ට දුරකථන ඇමතුමක් විත්, නායකයා විදියට දිගටම කටයුතු කරන බව දැනුම් දුන් බව අසා, මට විශාල සතුටක් ඇති විය.

කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධවී ධර්මය ඉගෙනගෙන නොසිටියානම්, මේ ආකාරයට සැමදේම හොඳින් බැලීමට අවස්ථාවක් නොලැබෙන්නට ඉඩ තිබින. එය කිරීමට පුලුවන් වූයේ ‘මේ මොහොත වැදගත් කොට සලකීම, නිවැරදි දැක්ම, ඇතිදේ ඇතිසැටියෙන් බැලීම’ යන වටිනා කියාදිම වල ආශිර්වාදයෙනි.

ගිය වර්ෂයේ ධර්ම ආචාර්යය අධ්‍යාපනය තුළින්, මියගිය අයට පින් අනුමෝදන් කිරීමේ වැදගත්කම ඉගෙන ගතිමි. මියගිය අයට පින් අනුමොදන් කිරීමේදි කෝසෙයි කායි එක වෙනමම නමක් ලබා දෙනවා (කයිමියෝ) වුවද ඒ ගැන අවබෝධයක් නොවිය. ‘මාගේ මියගිය අම්මාට කයිමියෝවක් ලබාගෙන පින් අනුමෝදන්

කර වන්දනා කරන්න' යැයි සොරිගුමා ශිබුචෝ සාන් කියා සිටියද කයිම්යෝ වල තේරුම හරි හැටි දැන් නොසිටි නිසා කල්දමමින් සිටියා. ධර්ම ආචාර්යය තනතුර ලබාගෙන ඒ අනුව කයිම්යෝ වල තවදුරටත් ගැඹුරින් තේරුම් ගැනීමට හැකිවිය. මම මගේ මවගේද කයිම්යෝව ලබාගෙන සූත්‍ර සක්ඛායනය කරමින් සිටිනවා.

වර්තමානයේ මම උලාන්බාතර් ශාකාවේ කයිම්යෝ ලිවීමට බාරගැනීමද, තැන්පත් කිරීමේ රජකාරියද කරමින් සිටිනවා. කලින් මම මගේ පහසුව අනුව සූත්‍ර සක්ඛායනය කලා. නමුත් දැන් රාජකාරියට මුල් තැන දෙමින් කයිම්යෝ ලබගැනීමට පැමිණෙන අයට එය භාරගෙන ඉක්මනින් කර දීමට කටයුතු කරමින් සිටිනවා. ඒ වාගේම හදවතින් සූත්‍ර සක්ඛායනා කිරීමට හැකියාව ලැබී තිබෙනවා. කයිම්යෝ ලබාගත් අය 'කයිම්යෝ ලබාගෙන මියගිය මුතුන් මිත්තන්ට සූත්‍ර සක්ඛායනයය කිරීමෙන් හොදක් වුනා' යැයි අසන්නට ලැබීමෙන් හදවත සතුටින් පිරී යනවා.

ගිය වර්ෂයේ කයිම්යෝ ලබාගැනීමට අයදුම් කර තිබූ එල්ඩිනෙට් ශාඛාවේ එක් සාමාජිකයෙකුට, එය ලබාදීමට අතපසු විය. මේ අවස්ථාවේ ධර්ම ප්‍රචාරනයේ දී එම සාමාජිකයාට කයිම්යෝ ලබාදී ප්‍රමාදයට සමාව ලබාගෙන, මුතුන් මිත්තන්ට සූත්‍ර සක්ඛායනයය සිදු කලා. උලාන්බාතර් ශාකාවට පැමිණිය පසු එම සාමාජිකයා කයිම්යෝ ලබාගත් නිසා එයට ස්තූතිපූර්වක හැඟීමෙන් ගොමෙයිනිචි දවසේ සූත්‍ර සක්ඛායනයය දිගින් දිගටම කරගෙන සිටිනබව අසන්නට ලැබී ඉමහත් සතුටක් දැනින.

කෝසෙයි කායි එකට සම්බන්ධ වීමට පෙර, මම අන් අයට කෘතවේදී වුනේ නැහැ. ඒවාගේම කරදරයකට පත්ව සිටින පුද්ගලයෙක් සිටින විට උදවු කිරීමට අවශ්‍ය වුවත් ලැජ්ජාව නිසා නොකල සිටියහ.

සාමාජිකත්වය ලබා ලබන වර්ෂයට අවුරුදු 10ක් සපිරෙන නමුත් දැන් මම ධර්මය ඉගෙන ගෙන හෝසාවලට සහභාගිවූ ආශිර්වාදයෙන්, මගේ හැඟීම් ප්‍රකාශ කරන තත්වයට පත්විය. උදහරණයක් ලෙස බසයට ගොඩවූ විට, බසයට මුදල් ගෙවීමට අපහසු වූ අයෙකු සිටියහොත් නොපැකිලිව මුදල් ලබා දී උදවු කිරීමට හැකියාව ලැබී තිබෙනවා. තව එක් පුද්ගලයෙකුට හෝ කෝසෙයි කායි සංවිධානයට සම්බනධ කොට ජීවිතයට සතුට ලගාකර දිය යුතු යැයි කියන ප්‍රාර්ථනයෙන් ධර්මය කියා දෙමින් කටයුතු කරනවා.

මම මේ වනතෙක් 5 දෙනෙකුව කෝසෙයි කායි කියාදීම් කියාදී ඩෝජෝවට ඒමට මගපාද දුනි. ඒත් රැකියාව කාර්යබහුල යැයි කියා කිහිප වතාවක්ම ආරධනා කලද පැමිණියේ නැත. මමත් සාමාජිකයෙකු වීමට කාලයක් ගත වූ නිසා, ඔවුන් ද ඒ ආකාරයට පත්වන තෙක් ඔවුන් සමග සහ සම්බන්ධතාවය පවත්වාගෙන යාමට කටයුතු කරමි.

මේ අවස්ථාවේ එල්ඩිනෙට් ශාඛාවේ බුදු පිළිමය තැන්පත් කිරීමට සමගාමීව උලාම්බාතර් ශාඛාවෙන් පරිත්‍යාග පෙට්ටියක් සාද ලබා දුනි. තවද මූලස්ථානයෙන් බුදු පිලිම වහන්සේ ලබා ගැනීමට නියමිත සාමාජිකයන් 2 නාටද පුජා විධි කියා දුන්හ. එල්ඩිනෙට් හෝසා නායිකාවගේ හැඟීම වැදගත්කොට සලකා, මෙතැන් සිටද උපරිමයෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි.

ධර්මයේ ආශිර්වාදයෙන් කලින්ට වඩා ආලෝකමත්ව හදවත විවර කරමින් මින් ඉදිරියටත් ධර්මය ඉගෙන ගනිමින් ප්‍රායෝගිකව කිරීමට සිතාසිටිමි. මෙම විශිෂ්ඨ ධර්ම මාර්ගය පෙන්වාදුන් සොරිගුමා ශිබුචෝ සාන්ට හදවතින්ම ස්තූති පූර්වකවෙනවා. හැමවිටම උදවු උපකාර කරන්නාවූ සාමාජිකයන් සැමදෙනාටම හදවතින්ම ස්තූතිපූර්වක වනවා.



සූත්‍ර සක්ඛආයනයේ නායකත්වය දරන අරිවුනා මහත්මිය

Living the

LOTUS

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු

## විවිධාර්ත සූත්‍රය
## ධර්ම දේශනාව, 2 වන පරිච්ඡේදය

ශ්‍රී විභූති බෝධිසත්වයන් වහන්සේ හා අනෙකුත් බෝධිසත්වයන් වහන්සේලා තම කටහඬ එක් කොට (අපත් ධර්මය පුරුදු පුහුණුවීමේ යෙදී සිටින්නන් ලෙස බුදු කෙනෙකු බවට පත් වීමට කෙලෙස ධර්මය අවබෝධ කර ගත යුතුදැයි) ලෙස විචාලහ.

## ස්වරූපය, දර්ශනය, සද්ධර්මය, නිර්වාණය

'විවිධාර්ථ සූත්‍රය සෑම කෙනෙකුවම සත්‍යාවබෝධයට මඟ පෙන්වන සූත්‍ර යකි. එය මෙම කාරණ අවබෝධ කරගැනීම තුලින් ආරම්භ වේ.

එනම් 'මෙම ලෝකයේ සෑම සියළුදෙයක්ම සාමානාත්මතාවයෙන් යුතුය, සුසංයෝගයකින් බැදී පවතී' ය. අපි ඉදිරියේ දෑසට පෙනෙනදේ, ලොකුය පොඩිය, ඇතිවෙනවා නැතිවෙනවා, නැවතී තිබෙනවා චලනය වෙනවා ආදි නොයෙකුත් වෙනස්කම් හා වෙනස්වීම් ඇති බව පෙනුනත්, එහි පදනම හරියට සද්ධර්මයේ කොතැනකින් බැලුවත් එක හා සමාන සේ, එකම එක සත්‍යයට (ධර්මයට) සෑම දෙයක්ම බද්ධ වී ඇත. ''

එය 'සෑම සියළු දෙයකම ස්වරූපය, දර්ශනය, සද්ධර්මය, නිර්වාණය ලෙස පවති'න බව කියාදෙන ධර්මයකි. ''ස්වභාවය'' යනු, සෑම සියළුදෙයකම ගුණය වේ. 'දර්ශනය' යනු, එම ගුණය දිස්වන ආකාරයයි.

'සද්ධර්මය' යනු, සෑම සියළුදයක්ම හේතුඵල වාදයට අනුව පවතී. එනම් සමහර දේවල ස්ථිර වු පැවැත්මක් තිබේ, සෑම සියළුදෙයකම මූලය ස්ථිරය ආදිය කිසිවක් එහි නැත. සෑම සියළුදෙයකම හරය සමාන බව එයින් අරුත් ගැන්වේ. 'නිර්වාණය' යනු, 'සුසංවාදයෙන් පිරි තත්වය' හදුන්වයි. සෑම සියළුදෙයක්ම ප්‍රාණවත්ව දියුණුවෙමින් සුවංවාදයෙන් යුතුවීම, පරමාදර්ශී බවේ සංකේතය වේ.

බුදුන් වහන්සේ මෙසේද දේශනා කලහ, 'නමුත් මනුෂ්‍යයින් එම සත්‍යය නොදන්නා බැවින් , සෑම සියලු දෙයක්ම තමා මූලික කරගෙන කල්පනා කොට මෙය හොදයි, මෙය හොද නැත , ආදිය සිතුමනාපෙට ක්‍රියාකර නොයෙක් ආකාරයේ අයහපත් සිතුවිලි ඇති කරගෙන එම පව් වලින් මිදීමට නොහැකිවී ඇත.

සියළුම බෝධිසත්වයනි, එම කරුණ හොදින් තේරුම් ගෙන, සියළු සත්වයන් කෙරෙහි සානුකම්පිත හදවත ඇති කරගෙන, මනුෂ්‍යයන්ව සම්පූර්ණයෙන්ම දුකින් මුදවා ගන්නවා යන අධිෂ්ඨානය ඇති කර ගන්න. එම අරමුණ ඉෂ්ඨ කර ගැනීමට, තව තවත් ගැඹුරින් සෑම සියළුදෙයකම යථා ස්වරූපය අධ්‍යනය කිරීම ඉතා වැදගත්ය.'

ලෙස, ජීවිතයේ ඇති වන ප්‍රශ්න වල හේතුව පැහැදිලි කර දී, මනුෂ්‍යයින්ව දුකින් මුදවා ගැනීමේදී බෝධිසත්වයන් කෙනෙකු තම හදවත පවත්වා ගත යුතු ආකාරය කියාදුනි. ඉන් පසු භෞතිකව පෙනෙන වෙනස්කම් වල ස්වරූපය , වෙනස්වීම් වල තත්වය හොදින් අධ්‍යයනය කල යුතුයි ලෙස පහත සදහන් කරුණු දේශනා කලහ.



## විවිධාර්ථ සූත්‍රය එකම ධර්ම පදනමකින් හටගනී

'මනුෂ්‍යයන් විශාල පිරිසකගේ කැමැත්ත, ස්වභාවය, ආශාවන් එකි නෙකට වෙනස් බැවින්, එකිනෙක පුද්ගලයන්ට දේශනා කරන්නාවු ධර්මයද ස්වභාවයෙන්ම එකිනෙකට වෙනස් විය යුතුය.

නමුත්, එම ගිණිය නොහැකි එකිනෙකට වෙනස් වු ධර්මයේ මූලය එකම සත්‍යය (ධර්මය) විසින් බිහිවී ඇත. එම එකම යථා ස්වරූපයකින් තොරය (විශේෂ හැඩයක් නොමැත) ය. එසේ ස්වරූපයකින් තොරවීම තුලින් සෑම විටම වෙනස්කම් වලින් තොර වනවා සේම, වෙනස්කම් නිර්මාණය නොකරයි. එබැවින් නිතරම සමානාත්මතාවයෙන් යුතුය. එය යථා ස්වරූපය ලෙස හදුන්වයි' මෙහිදී, බුදු දහමේ සදහන් ' යථා ස්වරූපය' යනෙහි අරුථ පැහැදිලිව සදහන් කර ඇත. සාමාන්‍යයෙන් යථා ස්වරූපය යනු, සරළව ' යථා



ස්වරූපය' ලෙස අර්ථ ගැන්වූවත්, විවිධ ධර්මයන්හි යථා ස්වරූපය ලෙස පවසන විට එහි ' යථා ස්වරූපය' යනු ගැඹුරු අරුථක් ඇති බව මතකයේ තබාගත යුතුය. එබැවින්, සාමාන්‍ය මනුෂ්‍යයන්ට 'යථා ස්වරූපය' යන්නෙහි අරුථ මෙහිදී තවමත් අවබෝධ කර ගැනීමට අසීරුය.

ශ්‍රී විභූති බෝධිසත්වන් වහන්සේ මෙසේ විමසූහ. 'බුදුන් වහන්සේ එවිට විවිධාර්ථ සූත්‍රය දේශනා කර වදාලහ. නමුත් මෙතෙක් කල දේශනාවන් සමඟ කොයි ආකාරයෙන් වෙනස්වීම් තිබෙන නිසාද , මෙම විවිධාර්ත සූත්‍රයේ ඉගෙන්වීම් පමණක් හොඳින් පුරුදු පුහුණු වූ විට විශිෂ්ඨ වූ විමුක්තිය ලබාගැනීමට හැකි වන බව පැවසුවේ ?'

එවිට බුදුන් වහන්සේ මෙලෙස පිලිතුරු දුන්හ.

## අවුරුදු 40 ස් ගණනක් වුවත් ඍජුවම සත්‍ය දේශනා කල අවස්ථාවක් නොමැත

'මම ධර්මාවබෝධය ලබා මෙලොව දෙස බැලු කල මෙලොව සිටින මනුෂ්‍යයිනට මෙම ධර්මය ඒ අයුරින්ම දේශනා කිරීම නුසුදුසු ලෙස තීරණය කලහ. ඉන්පසු ධර්මය ශ්‍රවණය කරන්නාගේ ධර්ම ඥානය , ස්වභාවය , ආශාවන්ට අනුකූලව ගැලපෙන දේශනා ක්‍රමය අනුගමනය කර විමුක්ති මාර්ගය අවබෝධ කර දෙමින් පැමිණියහ.

ඒ ආකාරයට සත්වයන්ට ගැලපෙන ආකාරයට ධර්මය දේශනා කරන විට, සත්‍ය වූ ධර්මය ඒ ආකාරයටම දේශනා කරන අවස්ථාවන් උදාවුවේ නැත. එබැවින් බුද්ධත්වයට පත්ව අවුරුදු 40 ස් ගණනක් වුවත් ඍජුවම සත්‍ය දේශනා කල අවස්ථාවක් නොමැත.

මනුෂ්‍යයින් යථාර්තය අවබෝධ කර ගැනීමේ අසමානකම් තිබේ. බුදුන් වහන්සේ දේශනා කළ සත්‍යය එකකි . එම යථාර්තය මනුෂයිනට අවබෝධ කර ගත හැකි අයුරින් බෙදා වෙන් කර දේශනා කරයි. මෙම තත්වය බුදුන් වහන්සේට පමණක් අවබෝධ වේ. එම නිසා බෝධිසත්වයන් වහන්සේ විමුක්තිය ලබා ගැනීමට සිතනවා නම් , අනිවාර්යයෙන්ම මෙම (විවිධාර්ථ සූත්‍රය) ධර්මය ඉගෙන ගෙන පුරුදු පුහුණුවීමේ යෙදිය යුතුය.

මම මෙතුවක් කාලයකට දේශනා කල කරුණු සත්‍යය වූ ධර්මයට පදනම් වූ කරුණු කාරණය. උදහරණයක් ලෙස, කොතැනක තිබෙන වතුර වුවද, වතුර වේ. නමුත් ඇළ පාරක, කාණුවක, පොකුණක, සාගරයේ ජලය සමාන වුවද, එකිනෙකට ටිකක් වෙනස්ය. මම දේශානා කල ධර්මයද මුල් අවධියේ කල දේශනා, මධ්‍යය භාගයේ කල දේශනා හා දැන් කරන්නාවු දේශනා සම්පූර්ණයෙන්ම සමානය ලෙස පැවසිය නොහැකිය. වචන වල සමානකම් තිබෙනවා ලෙස පෙනුනත්, අන්තර්ගතයේ ගැඹුර හාත්පසින්ම වෙනස්ය.

සෑම බුදු කෙනෙකුම දේශනා කරන්නේ එකම වූ සත්‍යයි. එම එකක් වූ සත්‍ය විශාල පිරිසකගේ හදවතේ ප්‍ර ාර්ථනා වලට අනුකූලව විවිධාකාරයට දේශනා කරයි. බුදුන්ගේ ස්වරූපයද එකකි. එම එකම ස්වරූපය, විවිධාකාරයට වෙනස් කරමින් නොයෙකුත් ආකාරයට ක්‍රියා කරයි. එබැවින් බුදු කෙනෙකු යනු ආශ්චර්යමත් ඍද්ධි බලයකින් යුතු අයෙකි. ශ්‍රාවක, පසේ බුදු අය පමණක් නොව, බුදුන්ට ඉතා සමීප බෝධිසත්වයන්ට පවා එම තත්වය අවබෝධ කර ගැනීමට නොහැකිය. එම හැඟීම බුදු කෙනෙකු බවට පත්වීමෙන් ලැබෙන තත්වයක් වාගේම බුදු කෙනෙකු පමනක්ම දැන ගන්නා දේය. එම සත්‍යාවබෝධය ලබා ගැනීම සඳහා මෙම දේශනා කරන විවිධාර්ථ සූත්‍රය ගැඹුරෙනුත් ගැඹුරට ශරීරයට බද්ධ කර ගත යුතුය.'

'සෑම සියළු දෙයම ස්වභාවය, දර්ශනය, සද්ධර්මය, නිර්වාණය, එකම ධර්ම පදනමක් තුලින් බිහිවේ' ලෙස ඉගෙන ගත් විට දළ වශයෙන් තේරුම් ගැනීමට හැකිවේ. නමුත් දළ වශයෙන් තේරුම් ගැනීම වුවත්, හද පත්ලෙන්ම අවබෝධ කර ගත්තාය යන අය නොමැත. එසේ වීමට නම්, බුදුන් වහන්සේ හා සමාන තත්වයෙන් ප්‍රඥාව වඩවාගත යුතුය. එසේ වුවිට බුදු කෙනෙකි. බුදුන් වහන්සේ, 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ', උපාය කෞෂලය නම් 2 වන පරිච්ඡේදයේ 'බුදුන් වහන්සේ නමකට පමණක් බුදුවරයෙකු සමඟ එකතුව සියළු දේවල යථාස්වභාවය මැනීමට පුලුවන' ලෙස සඳහන් වේ.

එසේ වුවත් අපි බලාපොරොත්තු අත් හැර නොගත යුතුය. ප්‍රඥාවට අධිපති ලෙස සලකන සැරියුත් තෙරුණ් වහන්සේද, මෙම 'විවිධාර්ථ සූත්‍රය' සවන් දීමෙන් ධර්මාවබෝධය ලබා නොගත්තහ. ඒ අනුව බුදුන් වහන්සේ විසින්, 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය'ද දේශනා කරමින් සියළුදෙනාටම ධර්මාවබෝධය සඳහා මඟ පෙන්වූහ. එබැවින් මෙම 'විවිධාර්ථ සූත්‍රය' කියවා, හොඳින් අවබෝධ නොවුවත් කමක්නැත. මෙහිදී සෑම සියළුදෙයකම 'යථා ස්වරූපය' පිළිබඳ මනසේ චිත්‍රයක් මවා ගැනීම පමණක් ප්‍ර මාණවත් වේ.

මේ මස සිට නික්යෝ නිවානෝ තුමා විසින් රචිත 『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』

කෝසේයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P16—P23)




## 'නිවැරදි ක්‍රියාව' සාමය උදකර ගැනිමේ වැදගත්ම දෙයකි

අගෝස්තු මාසය ආරම්භයේ සිටම 'යුද්ධය' හා 'සාමය' යන වදන් 2 ක නිතරම මතකයට නැගේ.

හිරොෂිමා හා නාගසකි වල 'පරමාණු බෝම්බ අනුස්මරණ දිනය' වෙනුවෙන් විවිධාකාර උත්සව පවත්වමින්, පරමාණු බෝම්බයෙන් ජීවිත හානි වූ අය වෙනුවෙන් හදවතින්ම නිවන් සුවය ප්‍රාර්ථනා කරමින් හා ලෝක සාමය ප්‍රාර්ථනා කරමින් නිශ්ශබ්දතාවයන් පවත්වයි.

'ඔබ සැමට නිවන් සුව, නැවත මෙවැනි දෙයක් ඇති නොවීමට වගබලා ගනිමු' ලෙස 1986 වසරේදී ලෝකයේ ආගමික නායකයන් ඉතාලියේ අසිසි නුවරදී, 'ලෝක සාමය ප්‍රාර්ථනා කිරීමේ' සැසියක් පැවැත්විය. එයට අනුගත වෙමින් ජපානයේ 'හි එයි ආගමික සමුළුව' හි එයි කන්ද මූලික කරගෙන සෑම අගෝස්තු මාසයකදීම පැවැත්වේ.

නිච්කෝ නිවනෝ තුමාගේ මාසික පණිවුඩයේ 'නිවැරදි ක්‍රියාව' යනු 'ගෞරවනීය හැගීමෙන් හා ලැජ්ජාසහිත හැගීමෙන්' යුතුව හදවත හා ක්‍රියාව එක් කොට කටයුතු කිරීමෙන් ඇතිවන යහපත් මානුෂීය සබධතා තුලින් පවුල් තුලත් රටේත් සාමය ගොඩ නැගීමට පාදකවන වැදගත් කරුණකි, ලෙස සදහන් විය.

එ ආකාරයට තමාගේ ශාරීරික ක්‍රියාවන් නිවැරදිව පවත්වා ගැනීම තුලින්, ලෝක සාමය වෙත පියවරක් තැබීමට හැකිවේ.

රි.කෝ.කා. අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී
කෝයිචි සයිතෝ මහතා




## Rissho Kosei-kai International Branches

**We welcome comments on our newsletter *Living the Lotus*:** living.the.lotus.rk-international@kosei-kai.or.jp